සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

10 ශ්‍රේණිය **සිංහල සාහිත්‍ය රසාස්වාදය** කාලය පැය 03 යි.

නම/ විභාග අංකයඃ

- **I** කොටසෙහි 1, 2 ප්‍රශ්නවලටත්, **II** කොටසෙහි 3 ප්‍රශ්නයටත්, **III** කොටසෙහි 4, 5, 6, 7, ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

(1) (i) සිට (v) දක්වා ඇති කොටස් කියවා ඒවා ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "එඹල ඒ තට අතවැසි කමට නිසි එකෙක් නොවෙයි ඇඳූරුකමට නිස්සෝය "

(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කා හට ප්‍රකාශකරන ලද්දක් ද?

(ආ) එම ප්‍රකාශය සිදු කළේ කුමන අවස්ථාවෙ දී ද?

(ii) "කලුණු ගුණින් යුතු උතුමන් සිත මහ රූ
දුදන බසින් නො යෙදෙයි කරනට නපුරු"

(අ) මෙම කවිය ඇතුළත් ග්‍රන්ථය රචනා කළේ කවු ද?

(ආ) එම ග්‍රන්ථය ඇතුළත් වන්නේ කුමන කාව්‍ය ප්‍රභේදයකට ද?.

(iii) තාත්තා අයියාගේ බැනියම ඉරා ඉවත් කළේය

(අ) ඉහත පාඨය උපුටාගත් පාඩම කුමක් ද?

(ආ) බැනියම ඉරා ඉවත් කිරීමට හේතුව කුමක් ද?

(iv) "මම දිය සායං පෙට්ටියක් ගෙනත් දෙන්නං"

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද? කාටද?.

(ආ) මෙම ප්‍රකාශය උපුටාගත් ග්‍රන්ථයේ රචකයා නම් කරන්න

(v) " රැක්මෙන් දෙවියනේ වෙලබත් බුදින්නේ දුප්පත් කම නිසයි මම පැල් රකින්නේ"

(අ) මෙම කවිය ඇතුළත් වන්නේ කුමන කාව්‍ය ප්‍රභේදයකට ද?

(ආ) මෙහි සඳහන් පුද්ගලයා පැල් රැකීමට හේතුව ලෙස දක්වා ඇත්තේ කුමක් ද?

(මුළු ලකුණු 4 × 5 = 20)

(2) පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කරගෙන රසාස්වාදයක් ලියන්න.

(1) නො හිමි සුවඳ විහිදෙන කසුතුරි නිමල
උතුම් මුව නැබෙහි තැබි බඹ නැණ විකල
වී නම් මෙමට මහ බඹු පදවි යම් කල
තබම් බොරු කියන දුදනන්ගේ දිව මුල

2) තිරසර ගුණෙන් යුතු උතුමන් හට පවර
සමුදුර සියල් කිඳලෙක තුඹසෙක සුනෙර
පුවතර මෙ දඹදිව මළුවෙක සිය ගෙදොර
ඔහුකර නොවන සැපතෙක් එ බැවින් කවර

(3) එන කල සතුන්හට සිරි සැපත මන කල
කස පල තුළෙහි දිය ලොඳ මෙන් වෙයි විපුල
යන කල එසිරි සම්පත් වැනසී සියල
ගජ ගල ඇතුළ මද සුන් දිවුල පල තුල

(4) නොමින් ලොව සියලු දේ දක්නා ඇසට
තමන් සැටි මඳක් වත් නො පෙනෙන ලෙසට
අනුන් දොස දකිති අනුවණ දන කපට
එ මෙන් සිය නුගුණ නො දකිති නියම කොට

(i) මෙම කවි පෙළෙන් සමාජයට ලබාදෙන උපදේශ කවරේදැයි දක්වන්න (ලකුණු 05)

(ii) කවියාගේ අරමුණ සාර්ථක කරගැනිම සඳහා භාෂාව හසුරුවා ඇති ආකාරය කෙබඳුද? (ලකුණු 05)

(iii) සත්ත්වයන්ට සැප සම්පත් ඇති වීම හා ඒවා විනාශවීම කවියා දක්වා ඇත්තේ කෙසේ ද? (ලකුණු 05)

(iv) මෙහි දැක්වෙන ආකාරයට අනුවන මිනිසුන් දකින්නේ කුමක් ද? නොදකින්නේ කුමක් ද? (ලකුණු 05)

(v) "සුනෙර" "ගජගල" යන වචනවල අදහස පැහැදිලි කරන්න (ලකුණු 05)

(මුළු ලකුණු 25)

## II කොටස

- පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් **එක** කොටසකට පමණක් පිළිතුරු සපයන්න.

(3) සීලවතී දේවි ප්‍රභාවතීන් දැක මේ කුමාරිකා යහපත් රූ ඇත්තී ය. මපුතණුවෝ විරූපියහ. ඉදින් මු උන් දිටුහු නම් එක දවසකුත් නොරඳා පලා යන්නාහ. ඊට නිසි උපායක් කෙරෙමියි සිතා ඉක්බිති බිසව මහ රජ, මාගේ යෙහෙළණියෝ මපුතණුවන්ට තිස්සහ. එතකුදු උවත් අපගේ වංශ පරම්පරාවෙන් පැවත එන චාරිත්‍රයෙක් ඇත. ඉදින් මු ඒ වූ ලෙස පිළිපදිත් නම් කැඳවාගෙන යම්හයි මදු රජ්ජුරුවන්ට කිවු ය. ඒ අසා මදු රජ්ජුරුවෝ "කවර ආචාරයෙක් දැයි" විචාළහ. අපගේ වංසයෙහි දරුගර්භයක් පිහිටන තෙක් ස්ත්‍රීහු දාවල් සාමිපුත්‍රයා දකින්ට නොලබති. ඉදින් මු එලෙස පවතිත් නම් කැඳවාගෙන යම්හයි කීවුය.

(*i*) මෙහි ම පුතුණුවන් යනුවෙන් සඳහන් වන්නේ කවුද? (ලකුණු 5)

(*ii*) ඔවුගේ ඇති අඩු පාඩුව කුමක් ද? (ලකුණු 5)

(*iii*) මෙහි සඳහන්වන චාරිත්‍රය කුමක් ද? (ලකුණු 5)

(*iv*) මෙම ජේදයේ සඳහන් තැනැත්තියගේ කවර ගති ලක්ෂණයන් ප්‍රකට වන්නේ දැයි පැහැදිලි කරන්න? (ලකුණු 10)

(මුළු ලකුණු 5 × 5 = 25)

<u>නැතහොත්,</u>

උපන්නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එයින් පිටත්තර වෙන විදියකින් නොවේ
එයින් එහෙම නම් තම යුතුකම හමුවේ
බියෙන් තැති ගැනුම අපහට තරම් නොවේ

නම්බුව කැමති අය ඇති නම් නො වී මුළා
ගම්මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලොම් සිදුරක තරම් වත් අඩ දබර නොලා
පිම්මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උපන් ගමේ බල උරුමය රැක  ගන්ට
සටන් කෙරුම සතුටක් නම් වැසි  යන්ට
බියෙන් නොගොස් අහු මුළු වල රිං  ගන්ට
ඉතින් යමව් ගම්මුන්ටම එක්  වෙන්ට

වදින්නේ නැතුව ලොකු නිළධාරින්  ට
තමන්ගේ බලය උරුමය රැක ගන්  ට
හිතින්වත් කැමති නම් එය කර ගන්  ට
ඉතින් අඩ ගසව් තම හිත මිතුරන්  ට

ඇතොත් ගමට ආදරයක් සිතින්  සිතා
අතත් පයත් ඔලුවත් වෙන වෙනම  කපා
කතත් කමක් නැහැ බියසුලු ගතිය  පපා
අයුක්තියට අත්දෙක ඔසවන්න  එපා

අපේ රට අපේ ජාතිය අපේ  ගම
අපේ අසල්වැසියා යන සියල්  ලම
අපේ අනට අවනත කරගෙන  වහම
අපේ නමට සලකන දිවි දෙමු  මෙහෙම

මුල් බැස තිබෙන ගම්මුන්ගේ සමගි  සැපා
සොලොවා මරා වළලන්නට  යොදා  උපා
කුලමල උගුල් අටවන  බොරු බණක්  පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට  එපා

(i) මෙහි සඳහන්කර ඇති යුතුකම් දෙකක් දක්වන්න. (ලකුණු 05)

(ii) විස්වාසයක් තබන්නට එපායයි මෙහි සඳහන් කර ඇත්තේ කවුරුන් පිළිබඳව ද?. (ලකුණු 05)

(iii) මෙම පද්‍ය පන්තිය තුළින් කවියා සමාජයට ලබාදෙන පණිවුඩය කුමක් ද? (ලකුණු 05)

(iv) මෙම පද්‍ය පන්තියේ භාෂාව එහි සාර්ථකත්වය සඳහා බලපා ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 25)

## III කොටස

- **ප්‍රශ්න අංක 4 සිට 7 දක්වා ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. (එක් පිළිතුරකට වචන 150ක් වත් තිබිය යුතුය)**

(4) පාඨක ශ්‍රාවක සිත් තුළ හාස්‍ය රසය ජනනය කරන අවස්ථා තුනක් කුස ජාතකය ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 15)

(5) ස්වාභාවික පරිසරය හා සිද්ධීන් යොදා ගනිමින් සමාජ සාරධර්ම විචරණය කිරීමට අලගිය වන්න මුකවෙටි තුමා ගත් උත්සාහය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 15)

(6) ජීවන වෘත්තීන් හා බැඳුණු අත්දැකීම් ජන කවියාට වස්තු විෂය වී ඇති ආකාරය උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 15)

(7) තුංමා හංදිය නවකතාවේ සිරිසේනගේ චරිතයෙන් පිළිඹිබු වන චරිත ලක්ෂණ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 15)

## පිළිතුරු පත්‍රය - I කොටස

01) (i) (අ) මදු රජ්ජුරුවන් විසින් , කුඹල්කරුට
(ආ) කුසරජු සැඳූ වළං රැගෙන මදුරජු හමුවීමට ගිය අවස්ථාවේ දී
(ii) (අ) අලගියවන්න මුකවෙටි තුමා (ආ) උපදේශ කාව්‍ය
(iii) (අ) වෙසක් පහන
(ආ) වෙසක් කූඩුව දැල්වීමට ගිය අවස්ථාවේ දී
බැනියමට ගිනි ඇල්ලීම
(iv) (අ) මහගම සේකර විසින් රචිත තුංමංහන්දිය නවකතාවේ මැන්ඩිස් අයියා විසින් කථකයාට වෙසක් කාඩ් ඇදීමට දිය සායං කෝ යයි විමසූ අවස්ථාවේ දී
(v) (අ) ජනකවි / පැල්කවි (ආ) දුප්පත්කම

02) (i) බොරු නොකියන ලෙස
උතුම් සරීරසාර ගුණයෙන් යුතු පුද්ගලයන්ට අත්නොවන සැපතක් නොමැති බව
සැපසම්පත් ඇතිවනවා මෙන්ම නැතිවී යන බව
අනුන්ගේ දොස් මිස තමන්ගේ අඩුපාඩු නොදැකීම
(ii) සරල භාෂාවක් යොදා ගැනීම / උපමා භාවිත කිරීම / ජනයා අවදි කිරීමට උචිත විධානාත්මක භාෂාවක් යොදා තිබීම.
නූතන මෙන්ම පැරණි භාෂාමය යෙදුම් භාවිතය
(iii) සත්ත්වයන්ට සිත් සතුටු කරවන සැප සම්පත් ඇතිවන විට කුරුම්බා ගෙඩිය තුළ ඇති ජලය හා ලොද මෙන් ප්‍රමාණයෙන් මහත් වන බවත් එම සැප සම්පත් විනාශ වී යන විට ඇතා විසින් ගිලින ලද දිවුල් ගෙඩියේ මඳය නැතිවන්නාක් හා සමානවන බවය
(iv) අනුන්ගේ දෝස දකියි
තමන්ගේ දොස් නොදකියි
(v) මහා මේරු පර්වතය, ඇතා විසින් ගිලින ලද

## පිළිතුරු පත්‍රය - II කොටස

(i) කුස රජු
(ii) විරූපීබව
(iii) දරු ගැබක් පිහිටන තුරු ස්ත්‍රීන්ට ස්වාමි පුරුෂයාව දවල් කාලයේදි දකින්න නොලැබීම
(iv) සීලවති බිසවගේ උපක්‍රම ශීලිබව
ප්‍රභාවතියට තම පුතු විවාහකරදීමට ඇති දැඩි කැමැත්ත
ප්‍රභාවතියේ රූප ශ්‍රීයෙන් වශීවී සිටීම
<u>නැතහොත්</u>

(i) බියෙන් තැති නොගැනීම
අඩ දබර නොවී සිටීම
මුලා නොවී සිටීම
ලොකු නිලධාරීන්ට බිය නොවී සිටීම
(ii) කුල මල උගුල් අටවන නිලධාරීන් පිළිබඳ
(iii) සරල බස් වහර / කට වහර / අනුප්‍රාස වදන්
(iv) නිදහස් නිවහල් මිනිසෙකු ලෙස තම යුතුකම් ඉටුකරමින් ජීවත්විය යුතු ආකාරය පිළිබඳ ප්‍රකාශවන පිළිතුරක් අපේක්ෂා කෙරේ

04, 05, 06, 07 යන ප්‍රශ්නවලට සිසුන් ලියා ඇති පිළිතුරෙහි අදාළත්වය , ප්‍රමාණත්වය , විචාරාත්මක බව සලකා ලකුණු ලබා දෙන්න